දුරකථන ) 0112669192, 0112675011
தொலைபேசி ) 0112698507, 0112694033
Telephone ) 0112675449, 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
E-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
Website )


සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) CE/EXU/01/2022
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය ) 2022/04/ 26
திகதி )
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதாரம் அமைச்சு
# Ministry of Health

පොදු චක්‍රලේඛ ලිපි අංක: 02 – 36 /2022

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ජාතික රෝහල

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

රේඛීය අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

අදාළ ආයතන ප්‍රධානීන් වෙත

## හෙද සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2022 (පළමු වාරය)

අංක 1837/8 හා 2013.11.19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, හෙද නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථාවට අනුව හෙද සේවයේ I ශ්‍රේණියට පත්වී වසර පහක් ගතවීමට පෙර සමත්විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය **2022.06.19** වන දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

**02 සුදුසුකම්**

- I ශ්‍රේණියට උසස් වූ හෝ අන්තර්ග්‍රහණය වූ හෙද නිලධාරීන්ට මෙම විභාගයට අයදුම් කළ හැක.
- I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වූ හෙද නිලධාරීන් අතුරින් **2010.11.01** දිනට I ශ්‍රේණියේ වසර 05 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කරන ලද හෙද නිලධාරීන් මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.
- එසේම පශ්චාත් ප්‍රාථමික හෙද විද්‍යාල (ජාතික හෙද අධ්‍යාපන ආයතනය) හි වසර $1\frac{1}{2}$ ක ඩිප්ලෝමා පාඨමාලාව හදාරා I ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා / අධ්‍යාපන / මහජන සෞඛ්‍ය) තනතුරු වල සිටින හෙද නිලධාරීන්ද මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ. අනෙකුත් සියලුම I ශ්‍රේණියේ හෙද නිලධාරීන් මෙම කාර්යක්ෂමතා කඩඉම පරීක්ෂණය සමත්වීම අනිවාර්යය වේ.
- **2010.11.01** දිනෙන් පසුව I ශ්‍රේණියට උසස්වීම ලබන සියලුම හෙද නිලධාරීන් මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටිය යුතුය.

සැ.යු.: **2022/05/20 දින වන විට I ශ්‍රේණියට පත්කර, අදාළ පත්වීම් ලිපිය ලබා ඇති නිලධාරීන්ගේ අයදුම්පත් පමණක් මා වෙත එවීමට කටයුතු කරන්න.**



385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. 385, வணக்கத்துக்குரிய பத்தேகம விமலவங்ச தேரோ மாவத்தை, கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.

## 03 අයදුම්පත්

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත් අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින් කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, අංක 385, සුවසිරිපාය, සෞඛ්‍ය අමාත්‍යාංශය, අධ්‍යක්ෂ (විභාග) වෙත **2022/05/20** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කළ යුතුය. තම අයදුම්පත සමඟ රාජකාරී ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු. 45.00 ක් වටිනා මුද්දර ඇලවූ 9" X 4" ප්‍රමාණයේ ලියුම් කවර 02ක් එවිය යුතුය. **ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත අයදුම්පත්ද කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

සැ.යු.: ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව අයදුම්පත්‍රය A4 කඩදාසියක පළමු පිටුවේ අංක 01 - 04 දක්වාත්, දෙවන පිටුවේ අංක 05 - 10 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියලුම අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

## 04 විභාග ගාස්තු

4.1 විභාගයට පළමුවරට ඉදිරිපත්වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. මීට පෙර අයදුම් කළද විභාගයට පෙනී නොසිටි අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු 25/- බැගින් අවලංගු නොකළ මුද්දර අයදුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා ඒවා නිසි ලෙස අවලංගු කළ යුතුය.

4.2 කිසිදු කරුණක් මත ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ.

## 05 විභාගයට ඇතුළත් කරගැනීම

5.1 නිසි පරිදි සම්පූර්ණ කර ඇති අයදුම්පත් එවන ලද අපේක්ෂකයින්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

5.2 විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාළ ආයතනයක් මඟින් විධිමත් ලෙස නිකුත් කරනු ලැබූ හැඳුනුම්පත
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය
(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

## 06 විභාග පරිපාටිය

මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය **පොදු කළමනාකරණය** හා පොදු හෙදකම යනුවෙන් රචනා මාදිලියේ ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වන අතර **කාලය - පැය 03** බැගින් වේ. එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා **ලකුණු 100** බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් ලකුණු 40ක් ලබා ගත යුතු අතර එක් වරකදී හෝ කිහිපවරකදී පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. නිලධාරීන් විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේදී අදාළ සියලුම විෂයන්ට අයදුම් කළ යුතුය. **තනතුරට බඳවා ගැනීමට පෙර සිදු හෙද / හෙදියන් වශයෙන් වන පුහුණුවට ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍යයෙන්ම පමණක් ඉල්ලුම් කළ යුතුය.**

## 07 විෂය නිර්දේශය

### 7.1 පොදු කළමනාකරණය

- රෝගී සාත්තු සැලැස්ම
- කාර්යමණ්ඩල සුපරීක්ෂණය හා අධීක්ෂණය
- වගකීමක් සහිතව කාර්ය පැවරීම - Delegation
- නායකත්වය - Leadership
- මානව සම්පත් කළමනාකරණය

7.2 පොදු හෙදකම

- ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණය (කරුණු 17 ට අදාළව)
- රෝග නිවාරණය හා සෞඛ්‍ය ප්‍රවර්ධනය
- අධ්‍යාපන විද්‍යා මූලධර්ම
- හෙද පර්යේෂණ මූලධර්ම
- වාට්ටු පරිපාලනය
- සන්නිවේදනය
- කණ්ඩායම් සංකල්පය
- කාර්යමණ්ඩල සංවර්ධනය

**ඉහත සෑම ප්‍රශ්න පත්‍රයක්ම රචනා මාදිලියේ ප්‍රශ්න අට (8)කින් සමන්විතය, එයින් ඕනෑම ප්‍රශ්න පහ (5)කට පිළිතුරු සැපයිය යුතුය.**

08 **විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම**

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ බලා උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩකරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

09 කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ රෝහලේ / ආයතනයේ සේවයේ නියුතු අදාළ නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ ද අතුළත් කර ඇත.

**Web Path:** www.health.gov.lk ⟶ Staff Access ⟶ Admin ⟶ Exam ⟶ Circular

සැ. යු. මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බල පැවැත්වේ.

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට
සෞඛ්‍ය අමාත්‍යාංශය

පිටපත් -
1. නි.අ.ජ. (අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ) - අ.ක.ස.
2. අධ්‍යක්ෂ (හෙද පාලන) I - අ.ක.ස.
3. අධ්‍යක්ෂ (හෙද පාලන) II - අ.ක.ස.
4. අධ්‍යක්ෂ (හෙද අධ්‍යාපන) - අ.ක.ස.
5. අධ්‍යක්ෂ (හෙද වෛද්‍ය සේවා) - අ.ක.ස.
6. අධ්‍යක්ෂ (පාලන) V - අ.ක.ස.
7. ත්‍රිවිධ හමුදාපතිවරුන් - අ.ක.ස.
8. ආයුර්වේද කොමසාරිස් - අ.ක.ස.
9. සියලුම හෙද විදුහල්පතිවරුන්ට - විභාගය පැවැත්වෙන දින මෙම විභාගය සඳහා ශාලා වෙන් කිරීම පිණිසයි.



385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. 385, வணக்கத்துக்குரிய பத்தேகம விமலவங்ச தேரோ மாவத்தை, கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.

EXU

කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි

# ආදර්ශ අයදුම්පත

## හෙද සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන

## කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2022 (පළමු වාරය)

**01.** (අ) I. අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්): ..........................................

..........................................

II. අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):

III. මුලකුරු සමඟ නම (සිංහලෙන්): ..........................................

..........................................

IV. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):

(ආ) I. I ශ්‍රේණියට පත් කළ/උසස් කළ/අන්තර්ග්‍රහණය කළ ලිපි අංකය : ..........................................

දිනය : ..........................................

II. 2010.11.01 දින වන විට I ශ්‍රේණියේ සක්‍රිය සේවා කාලය: ..........................................

III. දැනට ලැබෙන වාර්ෂික වැටුප: ..........................................

IV. ජංගම දුරකථන අංකය:

V. ජාතික හැඳුනුම්පත් අංකය:

VI. විද්‍යුත් තැපෑල: ..........................................

**02.** ඔබ මෙවර පෙනී සිටීමට බලාපොරොත්තු වන විෂයන් ඉදිරියේ ඇති කොටුව තුළ (√) ලකුණ යොදන්න. **පෙනී නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.**

පොදු කළමනාකරණය:

පොදු හෙදකම:

**03.** (අ) දැනට සේවය කරන ආයතනය (සිංහලෙන්): ..........................................

(ඉංග්‍රීසියෙන්): ..........................................

(ආ) මෙම ආයතනය අයත් වන්නේ: රේඛීය අමාත්‍යාංශයට:

පළාත් සභාවට:

(ඇ) පළාත් සභාවට නම් අදාළ පළාත : ..........................................

(ඈ) එය අයත් දිස්ත්‍රික්කය:

**(මෙම දිස්ත්‍රික්කයේ විභාග මධ්‍යස්ථානයක් නොමැති නම් ආසන්නතම විභාග මධ්‍යස්ථානයට අනුයුක්ත කරනු ඇත.)**

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" X 4" ප්‍රමාණයේ රු. 45ක මුද්දර ඇලවූ ලියුම් කවර 02ක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේද? ..........................................

(ඊ) I. තැපැල් ලිපිනය (සිංහලෙන්): ..........................................

..........................................

II. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්): ..........................................

..........................................

**04.** විභාගයට පෙනී සිටින මාධ්‍යය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි): ..........................................

**(තනතුරට බඳවා ගැනීමට පෙර සිදු හෙද / හෙදියන් වශයෙන් වන පුහුණුවට ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍යයෙන්ම පමණක් ඉල්ලුම් කළ යුතුය)**

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද? ..................................................................................................

(ආ) අයදුම්පත් ඉදිරිපත් කරන්නේ ප්‍රථමවරට නොවේනම් මුද්දර අලවා තිබේද? ..........................................................

මුද්දර කොටුව

06. අයදුම්කරුගේ සහතිකය

(අ) මගේ දැනුම හා විශ්වාසය පරිදි මෙම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් / ප්‍රථම වතාවට නොවන බැවින් රු: .................................................. ක් වටිනා මුද්දර අලවා ඇති බවත්, මෙම අයදුම්පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීති වලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

දිනය : ......................   ..................................................

අයදුම්කරුගේ අත්සන

07. විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරිනියගේ සහතිකය

........................................................................................ මහතා/මිය/මෙනවිය* I ශ්‍රේණියේ හෙද නිලධාරිනියක / නිලධාරියෙකු වශයෙන් මාගේ අංශයේ සේවය කරන බවත්, මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය : ......................   ..................................................

විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරිනියගේ අත්සන
(මුද්‍රාව තැබිය යුතුය)

08. පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ / නිලධාරිනියගේ සහතිකය

මෙම අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පෙර මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපිගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

දිනය : ......................

..................................................

නම සහ අත්සන

09. ආයතන ප්‍රධානියාගේ සහතිකය

........................................................... මහතා / මහත්මිය / මෙනවිය ....................................

නිලධාරියෙකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත්, අයදුම්පතේ ඇතුළත් කර ඇති තොරතුරු නිවැරදි බවත්, අයදුම්කරු විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බවත්/නොවන බවත්, විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් සහතික කරමි.

දිනය: ......................   ..................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන
[රබර් මුද්‍රාව තැබිය යුතුය]

10. විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය

........................................................... මහතා / මහත්මිය / මෙනවිය, ....................................

නිලධාරියෙකු වශයෙන් මාගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට / ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය: ......................   ..................................................

විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන
[රබර් මුද්‍රාව තැබිය යුතුය]

* - අනවශ්‍ය කොටස් කපා හරින්න.